

# හෙළ ගී අඹරේ පිපි දෙමළ පෙම් කැකුළ
# සූරියකුමාර් මුත්තලගේ

**"සූරියකුමාර් මුත්තලගේ" දශක පහකටත් වැඩි කාලයක් සිංහල ගී ගායනයෙහි නිරත දෙමළ ජාතික ගායන ශිල්පියෙකි. කලක් කැසට්පටි ගීතයෙහිද, තවත් කලක් ප්‍රසංග වේදිකාවෙහිද ජය ධජ නැන්වූ ඔහු සිංහල සංගීත රසිකයන් අතර නොනැසෙන ජනප්‍රියත්වයක් රදවා ගෙන ඇත්තේ පැරණි සිංහල චිත්‍රපටි ගී ගායන ශිල්පියෙකු ලෙසිනි. වත්මනෙහි කලාකරුවන් තුළ දක්නට නොලැබෙන ආකාරයේ අනතිමානී ගුණයෙන් හෙබි ඔහු "සන්නස" හා සම්මුඛ වූයේ මෙලෙසිනි. 0112-590320 සහ 0773-401005 දුරකථන අංක මගින් රසික ඔබට ඔහු හා සම්බන්ධවිය හැකිය.**



ශ්‍රීලාල් සෙනෙවිරත්න

**ඔබගේ නම ?**
වෙල්ලසාමි මුත්තලගු.
**ගම ?**
කොළඹ

**පාසල් ගියේ ?**
බම්බලපිටියේ ශාන්ත මරියා විද්‍යාලයට
**සංගීත ක්ෂේත්‍රයට පිවිසුණේ ?**
1959 ගුවන් විදුලියේ සරළ ගී ගායකයෙක් විදිහට

**වෙල්ලසාමි මුත්තලගු ''සූර්යකුමාර් මුත්තලගේ'' වුණේ කොහොමද ?**
මම 1959දි ගුවන් විදුලියේ සරළ ගී පරීක්ෂණයට සහභාගි වුණේ වී. මුත්තලගු නමින්. 83 කැසට් පටියකට ගායන කරන විට බුද්ධි කීර්තිසේන සහ අජන්තා රණසිංහ මගෙන් අහලා සූරියකුමාර් කොටස නමට එක්කළා සිංහල ගී කියන නිසා. එය හුඟාක් ජනප්‍රිය වුණා.

**ගුවන් විදුලියේ සරළ ගී ගායකයෙකු විදිහට කිව්වෙත් සිංහල ගීද?**
සිංහල ගී තමයි කීවේ. ගුවන් විදුලියේ මුල ඉදළම තිබුණේ සිංහලනේ. පසුව දෙමළ ගී ප්‍රචාරය වුණත් ඒවාත් දකුණු ඉන්දියාවේ ගී. මම මුලින්ම සරළ ගී පරීක්ෂණයට ඉදිරිපත් වුණොත් සිංහල ගායකයෙක් විදිහටයි. අදටත් වැඩිපුර කියලා තියෙන්නේ සිංහල ගීත.

**දෙමළ ජාතිකයෙකු වෙලා කොහොමද මේ විදිහට සිංහල ගී ගායනයට යොමු වුණේ ?**
කුඩා කාලේ ඉඳලා මට අහන්න ලැබුණේ සිංහල ගීත. ඒ නිසාම මම සිංහල ගීතයට හුඟාක් ආස වුණා. දමිළ ගී ගායනට මගේ කැමැත්තක් තිබුණොත් නෑ. බම්බලපිටියේ සෙන් මේරිස් විද්‍යාලයේ ඉගෙන කාලේ ඉඳලා මම සිංහල සින්දු කියනවා. ඉගෙන ගත්තේ ඉංග්‍රීසි මාධ්‍යයෙන්. අපේ ගෙදර රේඩියෝ එකක් තිබුණේත් නෑ. අහල පහල ගෙවල්වල රේඩියෝවලින් අහලා තමයි කීවේ. අපේ ගෙවල් ළඟ කානිවල් එකක් තිබුණා. එකේ ග්‍රැමෆොන්වලින් නිතර ගීත ප්‍රචාරය කළා. සුජාතා චිත්‍රපටියේ, සැඩ සුළං චිත්‍රපටියේ ගී දවස් තිහේම දානවා. ඒවා ඇහිලා අපිට මතක හිටිනවා. ඒවා අපි කියනවා. එහෙම තමයි මම ගායකයෙක් වුණේ. මගේ තාත්තා ඉන්දියාවේ ඉපදුණු කෙනෙක්. එයාට හොඳට සින්දු කියන්න හැකියාව තිබුණා. එයත් බලපාන්න ඇති. ඉස්කෝලෙදි නාට්‍ය රඟපාන්න ලැබුණත් සින්දු කියන චරිත තමයි මට ලැබුණේ. 1957 ගුවන් විදුලියේ ළමා ගී ගායනයට සහභාගි වුණා.

**පාසලේදි විෂයක් විදිහට සංගීතය හැදෑරීමක් කළාද ?**
අපි ඉගෙන ගන්න කාලේ ඉස්කෝලේ සංගීත විෂයක් තිබුණේ නෑ. මෑතක තමයි ඒවා ආවේ.
**ස්වතන්ත්‍ර ගී නිර්මාණ ගායනා කළේ නැද්ද ?**
ගුවන් විදුලියේ සරළ ගී පරීක්ෂණයෙන් 'බී' ශ්‍රේණියේ ගායකයෙක් විදිහට මම මුලින්ම තේරුණා. පසුව 'ඒ' ශ්‍රේණියටත්, පසුව සිංහල දෙමළ භාෂා දෙකෙන්ම අති විශිෂ්ඨ ශ්‍රේණියේ ගායකයෙක් විදිහටත් තේරුණා. එදා පටන් අද දක්වාම මම ස්වත්‍රන්ත්‍ර ගී තමයි කීවේ. හින්දි හෝ දෙමළ තනුවලට ගී කීවේ නෑ. හෙක්ටර් සිල්වා තමයි මට මුලින්ම ගීයක් ලියලා, තනුව හදලා දුන්නේ. දෙවනියට මොහමඩ් සාලි හේම ශ්‍රී ද අල්විස්ගේ පද රචනයකට මට ගී හදලා දුන්නා. ඊට ප්සසේ එම්.එස්. සෙල්වරාජා ගීත රාශියක් මට නිර්මාණය කරලා තියනවා. 1983න් පසුව කැසට් පටිවලට තමයි හින්දි තනුවලට ගී කීවේ. අර දෙන්නා තමයි මාව කැසට් ගී ගායනයට යොමු කරගත්තේ. ඒ.එම්. රාජාගේ සින්දු කියන්න ස්ටැන්ලි පීරිස් තමයි මාව තෝරාගත්තේ. මගේ ස්වතන්ත්‍ර සිංහල ගී නිර්මාණ ඇතුළත් තැටි විශාල සංඛ්‍යාවක් දැනටත් ගුවන්විදුලි සංස්ථාවේ තියනවා. ඒවා නිතර ප්‍රචාරය වෙන්නේ නැති නිසා වැඩිය ජනප්‍රිය නැහැ.ඉන් පසුව 50 දශකයේ ආව චිත්‍රපටි ගී මම නැවත ගැයුවා. ඒ වෙනකොට ඒ.එම්. රාජා ජීවත්වෙලා ඉන්නවා. දෙයියන්ගේ ආශිර්වාදයෙන් ඔහුගේ හඬට සමාන හඬක් මට ලැබිලා තියනවා. ඒ නිසා සමහරු හිතුවා ඒ.එම්. රාජා කියන්නේ මම කියලා. එහෙම කියපු සින්දු තමයි වැඩිපුර ජනප්‍රිය වුණේ. සිංහල චිත්‍රපටි හය හතක් සහ දෙමළ චිත්‍රපටි ගීත රාශියකත් පසුව ගායනා කළා.

**ආනන්ද සමරකෝන් පදරචනය කළ, කේ දක්ෂිණ මූර්ති සංගීත අධ්‍යක්ෂණය කළ, ලතා ගායනා කරන "කෝ අනේ අද දිනේ කිම වුණේද දරුවනි අහෝ" ගීතය දවසක් උත්සවයක් වෙලාවේ වාදනය කළාම ඉන්දීය මහකොමසාරිස් කාර්යාලයේ ඔක්කොම නැඟිට්ටා ඒක අපේ ජාතික ගීය කියලා හිතලා. මම කිව්වා මේක ජාතික ගීය නොවෙයි සිංහල චිත්‍රපටියක ගීතයක් කියලා. මුල් කාලේ අපේ චිත්‍රපටි ගීතත් ඒ තරම් ඉහළයි.**

**කොහොමද ''කලාවතී-සූර්යකුමාර්'' තරු යුවළ එක්වුණේ ?**
සැඩසුළං, අහංකාර ස්ත්‍රිය, සරදම් වැනි චිත්‍රපටිවල ගී... 'ජීවන ගමන මේ සංසාරේ', 'ප්‍රිතියෙන් සතුටින් ඉමු ඉන්න ඩිංගේ දැන්', 'ලෝකය පෙරළෙයි'... ගී මම කැසට් පටිවලට ගැයුවා. ඒවාට කලාවතීත් එක්වුණා. ඇයත් ගුවන් විදුලි සංස්ථාවේ ශිල්පිනියක්. දෙමළ සරළ ගී ගායනා කරලා තියනවා. ස්ටැන්ලි පීරිස් තමයි අපි දෙන්නා හොඳයි කියලා තෝරාගත්තේ. අපි හීනෙන්වත් හිතුවේ නැති දෙයක්.

**අසූව අනූව දශකවල ඔබ යුවළට ප්‍රසංග වේදිකාවල තිබුණු ඉල්ලුම දැන් කොහොමද ?**
ඒ කාලේ ප්‍රසංග වේදිකාවේ 'කලාවතී-මුත්තලගේ' යුවළට තිබුණු ඉල්ලීම අදටත් තියනවා. අපි දෙන්නම එකට ප්‍රසංගවලට යනවා. මොකද මාත් එක්ක යුග ගී ගායනය හොඳට කරන ශිල්පිනියක් වුණේ එයා. පෙම් කැකුළ පිපී නමින් මම ඒක පුද්ගල ප්‍රසංග 27ක් විතර කරලා තියනවා. දෙමළෙන් ප්‍රසංග 15ක් විතර කළා.
**ඔබ යුග ගායනා කරන්නේ කලාවතී සමඟ පමණක්ද ?**
නෑ. 2003 ජමුණා රානිව ලංකාවට ගෙන්නලා මගේ ඒක පුද්ගල ප්‍රසංගයේ යුග ගී ගායනට සම්බන්ධ කරගත්තා. ඒ වගේම ජික්කි, පී සුසිලා, එස්. ජානකී, සුජාතා අත්තනායක, ලතා වල්පොල එක්කත් ගායනා කළා.

**ඒ.එම්. රාජා ගායනා කළ චිත්‍රපටි ගී රාශියක් ඔබ ඉතාම සාර්ථකව පසුකාලයේ ගායනා කරනවා. ඒ.එම්. රාජා සමඟ සම්බන්ධය ඇතිවෙන්නේ කොහොමද?**
මට ඔහුව හමුවෙන්නේ මම ඔහුගේ ගී කියන්න පටන් ගත්තට පසුවයි. 1988 මම ඉන්දියාවට ගිහින් රාජා හමුවුණා. දැන් අර ''රාජමාලිගේ පරෙවියා වගේ'' කියලා ගීයක් යන්නේ... එහි මුල් ගීයේ තනු නිර්මාණය කළ ශිල්පියා තමයි ඒ.එම්. රාජා. ජමුණා රානි, ජික්කි, කේ. රානි, ඒ.එම්. රාජා... මේ සියලු දෙනා දකුණු ඉන්දියාවේ චිත්‍රපටි පසුබිම් ගායනා කරන ශිල්පීන්. ජෝති, වල්පොල, බෙග්, ජී.එස්.බී. ලතා වගේ පසුව ආව අපේ අයත් ඒ කාලේ ඉන්දියාවේ ගිහින් තමයි ගී ගායනා පටිගත කළේ. ටී.ආර්. පාපා, ආර්. සුදර්ශනම්, දක්ෂිණාමූර්ති, එස්.එස්. වේදා වගේ දකුණු ඉන්දියාවේ චිත්‍රපටි සංගීත නිර්මාණ ශිල්පීන් තමයි ඒ කාලේ සිංහල චිත්‍රපටි ගීතවලටත් සංගීත නිර්මාණය කළේ.

## සිංහල සමාජයේ ජීවත්වෙන දෙමළ කලා

**ශිල්පියෙක් විදිහට තිස් වසරක උතුරේ යුද්ධය ඔබ දකින්නේ මොන විදිහටද ?**
''පෙම් කැකුළ පිපී'' කැසට් එක අවුට් වුණේ 1983 අප්‍රේල්වල. 83 ජූලි කලබල ඇතිවුණා. මමත් මාස තුනක් අනාථ කඳවුරක සිටියා. පෙම් කැකුළ පිපී-2 කැසට් පටියට සින්දු කියන්න මා ගියේ කඳවුරේ සිටයි. 83 කලබල කාලෙත් සිංහල ගෙවල්වල මගේ කැසට් ගී වාදයනය වෙනවා අහන්න ලැබුණා. අවුරුදු තිහක යුද්දේ මම දකින්නේ මහ අපරාධයක් විදිහටයි. ඒකෙන් දෙපැත්තටම බර හානි වුණා. යුද්ධ කාලෙත් මම රණවිරුවන්ට සින්දු කියන්න උතුරේ කඳවුරු ගානේ ගියා. විජේසුන්දර වේරගොඩ තමයි එක්ක ගියේ. අපි සල්ලිවලට නෙවෙයි ගී කිව්වේ. ඒ කාලෙත් මිනිසු කැමති වුණේ නෑ යුද්දෙට. එහෙම වුණත් යුද්දෙ තිබුණා. ඒක අපි කාටවත් වළක්වාගන්න බැරිවුණා. කොහොමත් දැන් මිනිස්සු සතුටින් ජීවත්වෙනවා. ගිය මාසෙත් මම යාපනේ ගිහින් ආවා. පොඩි පොඩි අඩුපාඩු ප්‍රශ්න තියනවා තමයි. ඒවත් විසඳෙයි. මේ සමගිය ඉදිරියට වඩා හොඳ වෙයි කියලා තමයි මම හිතන්නේ. කිසිම භේදයක් නැතිවයි අපි මේ රටේ ජීවත් වෙන්න ඕනේ. දැන් කොළඹ අපි සිංහල, දෙමළ, මුස්ලිම් හැමෝම කිසිම ප්‍රශ්නයක් නැතුව ඉන්නවානේ. අවුරුදු තිහකට කලිනුත් අපි එහෙමනේ හිටියේ. මම වැඩිපුරම ඉන්නේ සිංහල අයත් එක්ක. අවුරුදු තිහ තුළ මේ විදිහේ දරුණු ප්‍රශ්නයක් ඇති කළේ දේශපාලකයන් ඔවුන්ගේ වාසියටයි. මේකට ඉදිරියේදී පැවැත්මක් නැහැ.

**අද රූපවාහිනී චැනල්වලින් බිහිකරන ''සුපර් ස්ටාර්ස්'' සහ මීට දශකයකට දෙකකට පෙර සිටි සුපර් ස්ටර්ස් ගැන මොකද හිතෙන්නේ ?**
ආනන්ද සමරකෝන් පදරචනය කළ, කේ දක්ෂිණ මූර්ති සංගීත අධ්‍යක්ෂණය කළ, ලතා ගායනා කරන ''කෝ අනේ අද දිනේ කිම වුණේද දරුවනි අහෝ'' ගීතය දවසක් උත්සවයක් වෙලාවේ වාදනය කළාම ඉන්දීය මහකොමසාරිස් කාර්යාලයේ ඔක්කොම නැඟිට්ටා ඒක අපේ ජාතික ගීය කියලා හිතලා. මම කිව්වා මේක ජාතික ගීය නොවෙයි සිංහල චිත්‍රපටියක ගීතයක් කියලා. මුල් කාලේ අපේ චිත්‍රපටි ගීතත් ඒ තරම් ඉහළයි. සිංහල චිත්‍රපටිවලට ගී නිර්මාණය කරන්න අපේ අය ඉන්දියාවට ගිය කාලෙත් ලංකාවේ ශිල්පීන් අතින් ඉන්දීය ශිල්පීන්ට නොදෙවෙනි ආකාරයේ ගී නිර්මාණය කෙරුණා. නමුත් දැන් සුපර් ස්ටාර්ස්ල වෙන තරුණ ළමයින් කරන ගී වල එවැනි බරසාර ගතියක් දකින්නට නැහැ. බොළඳ පදවැල් තමයි ගී විදිහට රචනා වෙන්නේ. ඒ කාලේ ගායකයන්ගේ හඬවල්වලට තිබුණු අනන්‍යතාවයත් මේ අයගේ හඬවල්වල නැහැ. තනු නිර්මාණත් දුර්වලයි. ගීතය අහලා ඉවර වෙනකොට මේ එකක්වත් රසිකයන්ගේ මතකයේ රැදෙන්නේ නැහැ. හොඳ නිර්මාණ එකක් දෙකක් තමයි කලාතුරකින් බිහිවෙන්නේ.

**පැරණි අයගෙනුත් බරසාර අලුත් නිර්මාණ නැහැ නේද?**
මෙහෙම දෙයක් තියනවා. දැන් නිර්මාණ කරන අය තනු නිර්මාණය කරගන්න පැරණි අයව සොයාගෙන යන්නේ නැහැ. බොහොම ලාබෙට ඒ වැඩේ කරගන්න තමයි යොමුවෙලා ඉන්නේ. මොහිදින් බෙග් ගායනා කරන ''සකල සතම බොදු බැතියෙන්'' ගීතය අහලා ඉන්දියාවේ එක්කෙනෙක් මගෙන් ඇහුවා ඒක ලංකාවේ කළ එකක්ද? ඉන්දියාවේ කළ එකක්ද කියලා. මටත් ඒ ගැන අදහසක් තිබුණේ නෑ. මම ඉෂාක් බෙග්ට කතා කරලා ඇහුවාම ඔහු කිව්වා එම්.කේ. රොක්සාමි කළේ කියලා. ඒ නිර්මාණ ඒ තරම්ම හොඳයි. සරත් දසනායක සංගීතය කළ මිහිදුම් සිහින චිත්‍රපටියේ සරා සඳේ සිනා සේළේ ගීතය මම ඒ සංගීතයටම දෙමළෙන් ගායනා කළා. ඒ චිත්‍රපටිය

35 වන පිටට